**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2020.**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරවමාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මාර්ග ආරක්ෂාව පළිබඳ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශ තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇතිබව මා දරන්නාවූ මතයවේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.**

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙනයා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයෙදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතවඋචිතවිගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තුවලසාධාරණත්වය සහ කළමණාකරනය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශ වන සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය.

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍යවේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>----------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| රක්ෂණ ආයතනවලින් ලැබෙන ආදායම නිවැරදි බවට තහවුරු කර නොගැනීම | පද්ධති හා පාලන ක්ෂේත්‍ර හා කාර්යසාධනය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කරනු ලබන බව | ආදායම් හඳුනාගෙන නිසි පරිදි ගිණුම් ගතකල යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>----------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණු ස්ථාවර තැන්පතු වටිනාකම රු.1,124,276 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී හඳුනාගෙන ගිණුම් ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වර්ෂයට අදාල වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල් | 43,768,526 | රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කල සියයට 01 හි දායකත්වයට අදාල ආදායම් උපලේඛන | අදාල රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල් වල නිවැරදිභාවය තහවුරුකර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විමසමින් රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කර විමසීම් සිදු කර ඇති අතර ඒ සඳහා මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. | අදාල රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල් වල නිවැරදිභාවය තහවුරුකර ගැනීම සඳහා අදාල ආයතනයන් වල සහතිකකල මූල්‍ය ප්‍රකාශ ලබා ගත යුතු වීම. |

### 1.6 නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙගුලාසි **110** | හානි පිළිබඳ ලේඛණයක් පවතවාගෙන ගොස් නොතිබුණි | ලේඛනයන් සකස් කරමින් පවතී | මු.රෙ 110 අනුව කටයුතු කලයුතු වීම. |
| (ආ) | මුදල්රෙගුලාසි**454 (2)** | සභාව විසින් විදුලි උපකරණ සටහන් කිරිම සඳහා ලේඛණයක් පවත්වාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ලේඛනයන් සකස් කරමින් පවතී | මු.රෙ 454 (2) අනුව කටයුතු කලයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **මුදල් රෙගුලාසි 891 (1)** | වත්කම් භාරව කටයුතු කරන නිලධාරීන් විසින් ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛනයන් සකස් කරමින් පවතී | මු.රෙ 891 (1) අනුව කටයුතුත කලයුතු වීම. |
| (ඈ) | **1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය සහ මුදල් රෙගුලාසි 502 (2) 11** | ආයතනය සතු ස්ථාවර වත්කම් සටහන් කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කරමින් පවතී. | අදාල භාණ්ඩාගාර චක්‍රලේඛ නියමයන්ට අනුව ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කලයුතුය. |
| (ඉ) | **2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 4.2.2 ඡේදය** | පාලක මණ්ඩල රැස්වීම් මාසිකව පැවත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබූ අතර පවත්වා තිබූ රැස්වීම් සඳහාද සියළුම සාමාජිකයින් නියෝජනය වීමක් සිදු වී නොතිබුණි. | .ඉදිරියේදී පැවැත්වෙන රැස්වීම් සඳහා සියලුම සාමාජිකයන් අනිවාර්යෙන් සහභාගී විය යුතු බවට දැනුවත් කිරීමට අදාල කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව පාලක මණ්ඩල රුැස්වීම් පැවැත්විය යුතුය. |
| (ඊ) | **8.8 ඡේදය** | මූලා බලතල පැවරීම වර්ෂය ආරම්භයේදීම සභාව මගින් අනුමත කරවාගත යුතු වුවද, එය අනුමත කර තිබුණේ 2020 පෙබරවාරි 28 දිනැති සභා වාරයේදීය. | 2020.02.06 දින සභාපති ධූරයට පත්වීමෙන් පසු පැවති පළමු සභා රැස්වීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ බලතල පැවරීම සඳහා අනුමැතිය ලබා ගත් බව. | චක්‍රලේඛ නියමයන්ට අනුව මූලා බලතල පැවරීම් කටයුතු සිදුකල යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ඔක්තෝබර් 31 දිනැති හා අංක PED 25(4)දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අතිරික්ත මුදල් බැංකුවකහෝ මූල්‍ය ආයතනයක ආයෝජනය කිරීමට පෙර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ (භාණ්ඩාගාරයේ) අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 14 වන දින මහජන බැංකුවේ රු. මිලියන 44 ක මුදලක් ආයෝජනය කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද රු.මි.44 ක මුදල ආයෝජනය සම්බන්ධයෙන් ජාතික සභාවේ හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන අදාළ මුදල ආයෝජනය සඳහා කටයුතු කර ඇත. | මුදල් ආයෝජනය කිරීම් අදාල අනුමැතිය මත සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.61,590,212 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 61,429,545 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහිරු. 160,667 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රක්ෂණ ආදායම් ලැබීම අඩුවීමට සාපේක්ෂව වියදමද සමාලෝචිත වර්ෂයේදී අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන රක්ෂණ සමාගම් වලින් වන දායකය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 1,134,312 කින්ද , ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර තැන්පත් පොලී ආදායම රු 4,080,486 කින්ද පහල ගොස් තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදමද රු 5,375,465 කින් පහල ගොස් තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට සාපේක්ෂව ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර තැන්පතු මත ගෙවනු ලබන බැංකු පොලී අනුපාතිකයන් පහල මට්ටමක තිබුණු අතර අනතුරු සිදුකර පලායාම සඳහා වන්දි ගෙවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 3,125,000 කින් පහල ගොස් තිබුණි

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපනය කිරීම අරමුණු කොටගෙන ජාතික සභාව පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත් කොමිෂමක් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටුකිරීමට නීතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට එය බාධාවක්ව තිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව,ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස පත් කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය නිර්දේශයන් කිහිපයකට යටත්ව ලැබී ඇති අතර,එම ලබා දුන් නිර්දේශ අනුව පෙර පැවති පනත් කෙටුම්පත අමාත්‍යාංශ ලේකම් තුමා ප්‍රධාන විද්වත් මණ්ඩලයක සහභාගීත්වයෙන් **2021.06.15** වන දින සංශෝධනය කළ අතර එසේ සංශෝධනය කරන ලද කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| **(ආ)** | ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි රක්ෂණ ආයතන 04 ක් විසින් සියයට 01 ක දායකත්ව මුදල් ප්‍රේෂණය කර නොතිබූ අතර සභාව විසින් ඒ පිළිබඳ පසුවිපරම් කිරීමට හෝ රක්ෂණ භාරය හරහා තෙවන පාර්ශවීය රක්ෂණයන් සිදු කරන්නේද යන්න පිළිබඳව තහවුරු කරගෙන නොතිබුණි. | මේ පිළිබඳ ලිඛිත තහවුරු කිරීමක් රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් ලබාගැනීමට කටයුතු කරනු ලැබූ අතර එම ලිපිය සඳහා පිළිතුරු ලද පසු අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි රක්ෂණ ආයතන පිළිබඳ පසුවිපරම් කිරීමට හෝ රක්ෂණ භාරය හරහා තෙවන පාර්ශවීය රක්ෂණයන් සිදු කරන්නේද යන්න පිළිබඳව තහවුරු කරගත යුතුවීම. |
| **(ඇ)** | 2016 හා 2019 වර්ෂවලදී මාර්ග ආරක්ෂණ අරමුදල සඳහා ලබාදෙනු ලබන දායකය සියයට 02 ක් දක්වා වැඩිකර ලබාදීමට සියළු රක්ෂණ ආයතන එකඟතාවය පළකර තිබුණද, 2020 වන විටත් එම වැඩිකළ දායකය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මාර්ග ආරක්ෂණ අරමුදල සඳහා ලබා දෙන දායකත්වය 2% දක්වා වැඩිකිරීම සඳහා වන යෝජනාව සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය සභා පත්‍රිකාවක් යොමු කර ලබා ගෙන ඇති අතර සියලුම රක්ෂණ | අදාල නීති හා රෙගුලාසි සංශෝධනය කර දායකය ඉහල නංවා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආයතන නියාමනය වන රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය 2021.04.30 දින ලබා දී ඇත.එමෙන්ම අදාල රෙගුලාසි පැනවීම සඳහා අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් සම්පාදනය වෙත යොමු කර ඇත. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හඳුනා නොගත් මෝටර් රථවලින් අනතුරට ලක් වූ පුද්ගලයන් සඳහා වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයේ උපදෙස් පත්‍රිකාව අනුව වන්දි ඉල්ලීම සඳහා ඉදිරිපත් වී තිබූ අයදුම්කරුවන්ට ප්‍රමාදයකින් තොරව වන්දි ලබාදිය යුතු වුවද, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට 2018 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුල ලැබී තිබුණු වන්දි අයදුම්පත් 06 ක් ඉදිරිපත් කළ දින සිට වර්ෂ 02 කුත් මාස 06 ක් ගත වී ඇතත් එම වන්දි ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වන්දි ගෙවීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කරනු ලැබේ. | වින්දිතයනට වන්දි ලබාදීම කාර්යක්ෂම කලයුතුවීම. |
| (ආ) | 2015, 2017 සහ 2019 වර්ෂවලදී තුවාලකරුවන් වෙනුවෙන් ලැබී තිබූ අයදුම්පත්‍ර 08 ක් සඳහා රු. 775,000 ක වන්දි මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණද අයදුම්පත් ලැබී අවුරුදු 01 මාස 02 ක් සහ අවුරුදු 05 ක් අතර ප්‍රමාදයකින් යුතුව වන්දි මුදල් ගෙවා තිබුණි. | ඉදිරියේදී වන්දි ගෙවීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කරනු ලැබේ. | වින්දිතයනට වන්දි ලබාදීම කාර්යක්ෂම කලයුතුවීම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආයතනවලින් රු. 43,768,526 ක දායක මුදල් ලැබී තිබූ අතර ඉන් රු. 4,275,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. එම මුදල දායකමුදල් ලැබීම්වලින් සියයට 10 ක ප්‍රතිශතයක් විය. ශ්‍රී ලංකාව තුල සිදුවන වාහන අනතුරු සම්බන්ධයෙන් සලකා බැලීමේදී වන්දි මුදල් ලබාගැනීම සම්බන්ධව මහජනතාවගේ නොදැනුවත්භාවය මීට හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.. | වන්දි ගෙවීම් පිලිබඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු සලසා ඇති බවත් ඉදිරියේදී මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනු ලැබේ. | වන්දි ලබාදීම පිලිබඳව මහජනතාව දැනුවත් කිරීම කලයුතුවීම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ප්‍රධාන අරමුණු වශයෙන් මාර්ග අනතුරු අවම කිරීම හා හප්පා පලාගිය අනතුරු සඳහා අසරණ වන පුද්ගලයන්ට වන්දි ලබාදීම වන අතර වර්ෂ 05 ක තොරතුරු අනුව හප්පා පලා ගිය අනතුරු 320 ක් පැවති අතර අයදුම්පත්‍ර ඉදිරිපත් වී තිබුණේ 261 ක් පමණකි. අයදුම්පත් ඉදිරිපත් නොකළ අනතුරු 59 ක් සම්බන්ධ පසු විපරම් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියට මේ සඳහා රථවාහන පොලිස් මූලස්ථානය සමඟ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමටත් මෙයට අමතරව ජාතික සභා රැස්වීමේදී ද මේ පිළිබඳ සාකච්ඡා කර කරුණු ඉදිරිපත් කර උපදෙස් ලබාගැනීමටත් කටයුතු කරනු ලැබේ. | රථවාහන පොලිස් මූලස්ථානය සමඟ සාමූහිකව කටයුතු කර ලබාගන්නාවූ දත්ත අනුසාරයෙන් වින්දිතයන් හඳුනාගෙන කටයුතු කිරීම. |

### 3.3 නිෂ්කාර්ය උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් මස ජපන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිළදී ගෙන තිබූ රු. 5,875,351ක් වටිනා රියදුරු පුහුණු උපකරණවලින් රියදුරු පුහුණු කිරීම් සාර්ථකව සිදුකර නොතිබූ අතර 2019 ජූනි 21 දිනෙන් පසු 2021 මාර්තු දක්වා පුහුණු කටයුතු නවතා දමා තිබීම හේතුවෙන් එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි | මේ සඳහා වන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ඉල්ලා ඇත.එම උපදෙස් ලැබීමෙන් පසුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතා හඳුනාගෙන පවත්නා වත්කම් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කල යුතුවීම |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 (4)(ඇ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ, සේවා සහ විවිධ ව්‍යාපෘති ඉටුකිරීම වෙනුවෙන් රු. මිලියන 49.28 කට සභාව විසින් සැලැසුම් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල සභාවේ අරමුණුවලට අදාළ කිසිදු කාර්යයක් සිදු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ කිසිදු කාර්යයක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉටුකර නොතිබුණි. | 2021 වර්ෂය වන විට අදාල කටයුතු විධිමත් පරිදි කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | සැලසුම් ප්‍රකාරව කටයුතු කිරීමට අවශය පියවර ගත යුතුය. |

**3.5 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පවත්වාගෙන ගොස් තිබූ ඉන්වෙන්ට්‍රි ලේඛනය විධිමත් පරිදි පවත්වාගෙන ගොස් නොතිබූ අතර එක් එක් ආයතන සඳහා බැහැරට ලබා දී ඇති භාණ්ඩ පිළිබඳ සටහන් නොකිරීම මත ආයතනය සතු භාණ්ඩවල ඌණතාවයක් පැවතුණි | අදාල ලේඛණ නියමිත පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | වත්කම් පාලනය පිළිබඳව අවධානය යොමුකල යුතුවීම |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් අනුමත කරවාගෙන බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීන් 05 දෙනෙකුද, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 05 දෙනෙකුද හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරියෙකුද ලෙස නිලධාරීන් 11 දෙනෙකු අනුයුක්ත කර අදාළ රාජකාරි ඉටුකරගෙන යමින් පැවතුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ වලට අදාළ වාර්තාව සකස් කරමින් පවතී | සභාව සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට කටයුතු කලයුතු වීම. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අනුව සංයුක්ත සැලැස්ම ඉකුත් වර්ෂ 5 ක කාලය සඳහා සකස් කලයුතු වුවද එසේ කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛන විධිවිධාන පරිදි කටයුතු කරනු ලබන බව | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කලයුතු වීම. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ මාර්ග ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් 20 ක් හා එය ඉටු කිරීම සඳහා ක්‍රියාකාරකම් 49 ක් දක්වා තිබූ අතර ඉන් වැඩසටහන් 14 ක් ඉටු කිරීම ආරම්භ කර ඇතත් එම වැඩසටහන් වල අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | රටේ පැවැති වසංගත විපත් තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වමි. . | සැලසුම් ප්‍රකාරව කටයුතු කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කලයුතුය. |

**4.3 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 ජුනි 29 දිනැති අංක DMA/2009/01 දරණ චක්‍ර ලේඛය ප්‍රකාර වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එවැනි රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කළමනාකරණ කමිටු රැස්වීම් වාර 01 ක් නිදහස් කරනු ලැබූ අතර එක් රැස්වීම් වාරයක් පවත්වන ලදී.ඉදිරියේදී රැස්වීම් වාර 04 ක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | නිසි පරිදි කළමනාකරණ කමිටු රුැස්වීම් පවත්වා ආයතනයේ ක්‍රියාකාරීත්වය පහසුවන ආකාරයට කටයුතු කලයුතු වීම.. |

**4.4 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PED 5.2.4 ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර සභාව විසින් අයවැය ලේඛණය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වර්තමාන සභාපති තුමන් ලෙස මා වැඩභාර ගනු ලැබුවේ 2020.02.06 දින වන අතර සභාපති ධූරයට පත්වීමෙන් පසු පැවැත්වූ පළමු සභා රැස්වීමේදී සමාලෝචිත | චක්‍රලේඛන විධිවිධාන වලට අනුගත විය යුතුවීම |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුව සඳහා 2020 පෙබරවාරි 28 වන දින සභා අනුමැතිය ලබාගෙන තිබුණි. | වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගනු ලැබේ. | |
| (ආ) | වැය විෂයන් 02 ක් සඳහා අයවැය ප්‍රතිපාදන සැලසීමකින් තොරව රු.1,947,545 ක වියදම් දරා තිබුණි | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අයවැය ලේඛනයට අනුව කළමනාකරණ කටයුතු සිදු කිරීමට අපොහොසත් වූ අතර අදාළ විචලනයන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | නිසි පරිදි ප්‍රතිපාදන අවශ්‍යතා හඳුනාගෙන අයවැය ඇස්තමේන්තු සැකසිය යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සකස් කල අයවැය ඇස්තමේන්තුව හා තත්‍ය වියදම සැසඳීමේදී සියයට 04 සිට සියයට 651 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය විය | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අයවැය ලේඛනයට අනුව කළමනාකරණ කටයුතු සිදු කිරීමට අපොහොසත් වූ අතර අදාළ විචලනයන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | නිසි පරිදි ප්‍රතිපාදන අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිපාදන සැලසීම සිදුකල යුතුය . |

## 4.6 තිරසර සංවර්ධන අරමුණු.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/5P/5dg/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්ගෙන් මාර්ග ආරක්ෂණයට අදාළව අරමුණු 03 ක් හඳුනාගෙන ඇති අතර ඒට අදාළ ක්‍රියාකාරකම්ද සහිතව සභාවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන සැලසුම් සකස් කිරීම. |